# අධ්‍යාපන අමාත්‍යාංශය

## නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය

# ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

# පුරප්පාඩු

අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ පවතින ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා දෛනික පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. වඩු කාර්මික - (PL -3)**

**02. පෙදරේරු - (PL -3)**

**03. සේවාකරු (වාහන සේවා කිරීම) - (PL -3)**

**04. කම්මල්කරු - (PL -3)**

**සුදුසුකම්** : තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය තුළ නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතරවැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් තනතුරට අදාළව ලබා තිබීම හෝ වසර 03 ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : දෛනිකව රු. 1,636.33

**බඳවා ගැනීමේ ක්‍රමය** : ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

**05. කම්කරු- (PL-1)**

**සුදුසුකම්** : අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.

**වැටුප් පරිමාණය** : දෛනිකව රු. 1,583.33

**බඳවා ගැනීමේ ක්‍රමය** : සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

**සියලුම තනතුරු සඳහා අදාළ පොදු කොන්දේසි -**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මානසික හා කායික වශයෙන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු විය යුතුය.
- ඉතා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා දීමනාවෙන් 08% ක් අයකර ගනු ලබන අතර ඊට ආයතනයේ දායකත්වය 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා 3% ක් වේ.

**අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.**

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික

(ඇ) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

(ඈ) ජාතික හැඳුනුම්පත

සම්පූර්ණ විස්තර සහිත අයදුම්පතක් තමා විසින් සහතික කරන ලද සහතිකවල පිටපත් සමග 2024.04.21 දිනට ප්‍රථම කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය. අංක 582. ගාලු පාර, ගල්කිස්ස යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර නිවැරදිව සඳහන් කළ යුතු අතර කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**අධ්‍යක්ෂ - විදුහල්පති,**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,**
**අංක 582, ගාලු පාර, ගල්කිස්ස.**